# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2019 අගෝස්තු මස 09 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2019.08.09 දින නිකුත් කරන ලදී)**


# උකස් (සංශෝධන)

**(89 වන අධිකාරය වූ) උකස් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මුදල් අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් (89 වන අධිකාරය වූ) උකස් පනතට 68අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ 2019 අංක  දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් පසුව උකස් පනතේ III වන කොටස චංචල දේපළ සම්බන්ධයෙන් අදාළ වීම සීමා කිරීම වේ.

උකස් (සංශෝධන)

එල්.ඩී.— ඕ. 65/2017

**(89 වන අධිකාරය වූ) උකස් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2019 අංක  දරන උකස් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් නියම කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

2. (89 වන අධිකාරය වූ ) උකස් පනතේ 68 වන වගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය එම ප්‍රඥප්තියේ 68අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:-

89 වන අධිකාරයට 68අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

“III වන කොටස චංචල දේපළවලට අදාළ වීම.

68අ. මේ පනතේ III වන කොටසේ විධිවිධාන, 2019 අංක  දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව එම සුරක්ෂිතලත් ගනුදෙනු පනතේ විධිවිධාන සමඟ අනනුකූල නොවන තාක් දුරට පමණක් චංචල දේපළ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.”.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.